# කටුසෑය දාගැබට මානව ක්‍රියා නිසා සිදුවන හායන

පී.කේ.ඩී.ඩී. පිටිගල[1], ඩී.පී. ද සිල්වා[2], ජී.ජී.එන්.පී. ගුණරත්න[3]

ක්‍රි.ව 8-9 වැනි සියවස්වල මිහින්තලා ආරාම සංකීර්ණය ඉදිකිරීම සඳහා භාවිත කරන ලද කම්හල් උපකරණ හා ආයුධ තැම්පත් කරමින් ඉදිකළ පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස කටුසෑය හැඳින්විය හැකිය. කටුසෑය පුරාවිද්‍යා ස්මාරකය වර්තමානය වන විට මානව ක්‍රියාකාරිත්වය නිසා හායනයට ලක්වීම පිළිබඳව අවධානය යොමු කිරීම මෙහි පර්යේෂණයේ අරමුණ වේ. මිනිසුන් තුළ පවතින දැඩි භක්තිය පෙරදැරිකරගෙන සිදුකරන ඇතැම් පූජාවිධි නිසා නොදැනුවත්වම මෙම පුරාවිද්‍යා ස්මාරකය හායනයට ලක් වී ඇත. ඒ අනුව ඇදහිළි හා විශ්වාස මුදුන් පමුණුවාගෙන සිටින මිනිසුන් ස්තූප ගර්භය, ජේසා වළලු, මුරගල්, ආරකෂිත ගල්බැමි, පියගැට පෙළ දෙපස මත පහන්, හඳුන්කූරු, කපුරු ආදි පූජා ද්‍රව්‍යය දැල්වීම නිසා එම ස්ථාන දුර්වර්ණ වී එහි ඇති වටිනාකමට තර්ජනයක් වී ඇත. තව ද මිනිසුන් විසින් ස්තූපය කිරි දියරෙන් නැහැවීමත් කහ දියර ඉසිමත් තුළින් පාෂාණවලින් නිර්මිත ජේසා වළලු මත සුදු පැහැති පුල්ලි ලෙස ලයිකන නිර්මාණය වී දුර්වර්ණ ස්වභාවයක් ගෙන ඇති අතර දිගු කාලයක් එසේ පාෂාණ මත ලයිකන ඇති වී තැම්පත් වී තිබීම නිසා ජේසා වළලු නිර්මාණය කර ඇති පාෂාණ හායනයට ලක් වී තිබේ. විවිධ භාරහාර හා යතිකා සඳහා මිනිසුන් විසින් රැගෙන එනු ලබන පලතුරු හා කිරිබත් ආදිය මෙහි පිළියෙළ කොට ඉවතලන අපද්‍රව්‍ය ඉඳුල්, පොලිතින්, ප්ලාස්ටික් වැනි දෑ අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා වඳුරන්, රිළවුන් වැනි සතුන්ගේ ගහනය ස්මාරක අවට වැඩි වී තිබේ. එමඟින් ස්මාරකයේ සෞන්දර්යාත්මක අගයන්ට හානි වී ඇති අයුරු දැකිය හැකිය. යහපත් හා අයහපත් ඇදහිලි විශ්වාස මත පදනම්ව බටහිර දිශාවේ පිහිටි නාගපෙන හතක් සහිතව කැටයම් කර තිබුණේ යැයි සැලකෙන නාගපෙන කැටයම මත පොල් ගැසීම නිසා අද වන විට එය සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් ඇත. එසේම මුරගල් මත කැටයම් කර ඇති බහිරව රූප මත හුණුදියර ගල්වා පූජාව සිදුකර ඇති නිසා එම බහිරව කැටයම්හි සියුම් අංග ලක්ෂණ මැකී ගොස් තිබේ. කටුසෑය ස්මාරකය බෞද්ධ සංකල්පය මත පදනම්ව නිර්මාණය වුවත් වර්තමානය වන විට විවිධ අභිචාරයන් මුල්කර ගෙන වෙනත් ඇදහිළිවලට යොමුවන අයුරු දැකිය හැකිය . එබැවින් මෙම ස්මාරකය හා බැඳුණු ස්පෘෂ හා අස්පෘෂ සංස්කෘතික උරුමය මෙකී මානව ක්‍රියා නිසා හායනය වන අතර එම තත්වයන් වලක්වා ලමින් මෙහි පවතින අගයන් ආරක්ෂාකර ගැනීම වැදගත් බව පෙන්වා දියහැකිය.

**ප්‍රමුඛ පද :** ඇදහිලි, කටුසෑය, පුරාවිද්‍යා ස්මාරකය, විශ්වාස, හායනය

[1 2 3] පුරාවිද්‍යාව හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
dewminimatugama@gmail.com